# 5 සුවෙන් සිටින්නට



**"විදුහල්පතිතුමනි, සුබ උදෑසනක් වේවා!"**

"සුබ උදෑසනක් වේවා! මම සුනිල්ට එන්න කිව්වේ පොඩි වැඩක් කරන්නට. අපට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් නිවේදනයක් එවලා තියෙනවා. ඒ නිවේදනය අද පන්තිවලට දනුම් දෙන්න ඕන."

"විදුහල්පතිතුමනි, නිවේදනයේ තියෙන්නෙ මොකක් ද?"

"ඩෙංගු උණ රෝගය වළක්වා ගැනීමට කටයුතු කිරීම ගැන"

"හොඳයි, මම මේ නිවේදනය පන්තිවලට දනුම් දෙන්නම්."



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# ඩෙංගු රෝගය පැතිරීම වළක්වා ගනිමු.

මේ දිනවල ඉතා ශීඝ්‍රයෙන් ඩෙංගු රෝගය පැතිරී ගෙන යනවා. එය මාරාන්තික රෝගයක්. ඩෙංගු උණ පතුරුවන්නේ මදුරුවන්. උන් බෝවෙන්නේ පිරිසිදු ජලයෙයි. වතුර එකතු වන තැන්වල උන් බිත්තර දමනවා.



මේ ඩෙංගු මදුරුවන් බෝවීම අඩු කර ගැනීමට අපට විශේෂ ක්‍රම කිහිපයක් අනුගමනය කරන්න පුළුවන්. එයින් කිහිපයක් පහත දැක්වෙනවා.

- ★ ගේ අවට පිරිසිදු ව තබා ගන්න.
- ★ කුණු කසළ පුළුස්සා හෝ වළලා හෝ විනාශ කරන්න.
- ★ තැඹිලිකෝම්බ, වතුර එකතු නො වන ලෙස කුඩාවට කපා දමන්න.
- ★ මල් බඳුන්වල හා කූඹි ගුල්වල පිරෙන වතුරවලට ලුණු කැට ස්වල්පයක් දමන්න.
- ★ මල් බඳුන්වල පුරවා ඇති ජලය නිතර මාරු කරන්න.
- ★ නිවෙස්වල ඇති පරණ ටයර්වලට වැලි පුරවන්න.
- ★ ඒවායේ වතුර නො රැඳෙන ලෙස සිදුරු කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



★ වහලේ වැහි පිහිලි තුළ වතුර රැඳීමට ඉඩ නො තබන්න.

★ අවශ්‍ය විටක දී ප්‍රදේශයේ සෞඛ්‍ය නිලධාරියාගෙන් උපදෙස් ගන්න.

## ක්‍රියාකාරකම 1

(i) මෙහි ඇති නිවේදනය ශබ්ද නගා කියවන්න.

(ii) ඔබට ලැබෙන තවත් එවැනි නිවේදන සොයා පන්තිය ඉදිරියේ කියවන්න.

(iii) ඔබ කැමති මෙවැනි නිවේදනයක් ලියන්න.

## ක්‍රියාකාරකම 2

★ සියලු ★ විනාශ ★ ලක්ෂණ

★ කසළ ★ විශාල

මෙහි තද කළු පාටින් ඇති අකුරු හඳුනාගන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | | |
|---|---|---|
| ශ | - | තාලුජ |
| ෂ | - | මූර්ධජ |
| ස | - | දන්තජ |

(i) මේ අකුරු නිවැරදි ව උච්චාරණය කරන්න.

(ii) මෙවැනි අකුරු ඇති පද පාඩමෙන් සොයා ලියන්න.

## ක්‍රියාකාරකම 3

පහත දැක්වෙන පද ඔබේ අභ්‍යාස පොතේ ලියා ශබ්ද නගා කියවන්න.

- ★ කසළ
- ★ ආදර්ශ
- ★ භාෂාව
- ★ විශේෂ
- ★ ශාසනය
- ★ වර්ෂාව
- ★ විනාශ
- ★ පුරුෂයා
- ★ අක්ෂර
- ★ විශ්වාස
- ★ සතුට
- ★ ශුද්ධ
- ★ ලක්ෂණ
- ★ ශබ්දය
- ★ සම්මත
- ★ උෂ්ණ
- ★ වාසනාව
- ★ විශාල

## ක්‍රියාකාරකම 4

පහත දැක්වෙන එක් එක් පදයේ හිස්තැනට සුදුසු අකුර වරහන තුළින් තෝරා සම්පූර්ණ කරන්න.

(i) ආ_ර්වාදය

(ii) _න්නිවේදනය

(iii) ප්‍රදර්_නය

(iv) විශේ_

(v) පුළුස්_නවා

(vi) පිරි_ දු

(vii) _ත්‍රයෙන්

(viii) ලක්_ය

(ix) ප්‍රදේ_ය

(x) කොට්ඨා_ය

( ශ, ෂ, ස, ශි. සි, සා, ශී, ෂ, ශ, ස )

## ක්‍රියාකාරකම 5

පහත දැක්වෙන පද ගළපා වැකි සාදන්න. සුදුසු තැන ප්‍රශ්නාර්ථ ලකුණ ( ? ) යොදන්න.

(i) කුණු / වළලා / කසළ /ඕනෑ ද / දමන්න

(ii) වතුරේ / මදුරුවන් / බෝ / වෙනව ද / ඩෙංගු

(iii) බෝ / වෙනව ද / උණ / ඩෙංගු

(iv) පුළුවන් ද / නිවේදනය / කියවන්න / මේ

(v) කිව්ව ද / මට / එන්න / ඔබ

## ක්‍රියාකාරකම 6

★ සුබ උදෑසනක් වේවා!

★ අනේ! වෙච්ච කරදරයක්

පහත දැක්වෙන වැකිවල සුදුසු තැන්වලට හර්ෂාදි ලකුණ ( ! ) යොදන්න.

1. ඔබ සැමට දීර්ඝායුෂ ලැබේවා
2. අහා හරි ලස්සනයි
3. අනේ මට හරි කරදරයි
4. ඔබට ජයවේවා
5. අහෝ පුදුම දුකක්

## ක්‍රියාකාරකම 7

පහත දැක්වෙන ඡේදය, හර්ෂාදි ලකුණ, ( ! ) ප්‍රශ්නාර්ථ ලකුණ ( ? ) සහ තිත ( . ) යොදා අභ්‍යාස පොතේ නැවත ලියන්න.

අපෝ බෙහෙත් සාප්පුවේ හරි සෙනග ඉක්මනට එන්න බැරි වෙයි ද ආ අර ළමයා ගියා ද ඉක්මනට බෙහෙත් ගන්න පුළුවන් වෙයි එපා එපා යන්න එපා ලෙඩාට අමාරු ද අයියේ හුඟක් අමාරුයි වගේ ඉක්මනට එන්න.

## ක්‍රියාකාරකම 8

විරාම ලකුණු ගැන සැලකිලිමත්වෙමින් පහත දැක්වෙන ඡේදය නිසි උච්චාරණයෙන් යුතුව ශබ්ද නගා කියවන්න.

ඩෙංගු කියන්නේ වයිරසයක් මගින් බෝවෙන රෝගයක් නේද? ඩෙංගු බෝකරන මදුරු වර්ග දෙකක් ඉන්නවා. ඒ මදුරුවෝ දෂ්ට කිරීමෙන් මෙම රෝගය මිනිසාට බෝ වෙනවා. මේ රෝගයේ ලක්ෂණ මොනවා ද? තද උණ, බඩේ කැක්කුම මේ රෝගයේ සාමාන්‍ය ලක්ෂණයි. මේවා දින තුන හතරකින් පමණ අඩු වී රෝගය සුව වෙනවා. නමුත් සමහර රෝගීන් ඩෙංගු රක්තපාත තත්ත්වයට පත්වෙනවා. ඩෙංගු රක්තපාත උණ රෝගයේ ලක්ෂණ දන්නවා ද? හම යට කුඩා රතු පැහැති පැල්ලම් මතු වීම, ඇස් රතු වීම, නාසයෙන් ලේ ගැලීම, විදුරුමස්වලින් ලේ ගැලීම, වමනය කළු හෝ දුඹුරු පැහැවීම රෝග ලක්ෂණ වේ.

## ක්‍රියාකාරකම 9

පහත සඳහන් මාතෘකාවලින් ඔබ කැමති එකක් තෝරා ගෙන රචනයක් ලියන්න.

★ අපේ ගෙදර ★ මගේ සුරතලා

★ අපේ පාසල ★ අපේ ගම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.